# පථය, පරිශ්‍රය සහ ජනාවාසය: පුරාවිද්‍යාත්මක ස්ථාන හඳුනාගැනීම සහ අර්ථ දක්වීම් පිළිබඳ ගැටලු කිහිපයක්

රාජ් සෝමදේව

## හැඳින්වීම

පථය, පරිශ්‍රය සහ ජනාවාසය යන සංකල්ප තුන පුරාවිද්‍යාත්මක සන්දර්භයක දී භාවිතයට පැමිණෙන ආකාරය පිළිබඳ ගැටලු කිහිපයක් මෙම ලිපියේ දී අවධානයට ලක් කරයි. මෙහි උද්ධෘතයට ඇතුලත් 'පථය' යන්න ඉංග්‍රීසි භාෂාවේ එන locus යන්නට ද 'පරිශ්‍රය' යන්න site යන පදයට ද සමාන වන අර්ථයෙන් මෙහි යොදා තිබේ (පුරාවිද්‍යාත්මක සන්දර්භය තුළ පරිශ්‍රය යන සංකල්පය වර්ධනය වූ ආකාරය පිළිබඳ ඥානවිභාගාත්මක අධ්‍යයනයක් සඳහා බලන්න Dunnel,1992). මේ සියලු ම පද පුරාවිද්‍යාවේ සුලභව භාවිතවන්නේ පුරාවිද්‍යාත්මක අර්ථයක් ඇති ස්මාරක හෝවන ස්ථාන හඳුනාගැනීම සහ වාර්තා කිරීමට අදාළවය. පුරාවිද්‍යාත්මක ක්‍රියාවලිය තුළ මෙකී පද භාවිත කිරීමේ දී පැන නගින න්‍යායාත්මක සහ ප්‍රායෝගික ගැටලු පිළිබඳව මෙතෙක් ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාව තුළ එපමණ අවධානයක් යොමුව ඇති ආකාරයක් නොපෙනේ. මෙම ලිපිය ඒ පිළිබඳව මූලික සාකච්ඡාවක් ඇරඹීමට වෑයම් කරයි. ලිපියේ පළමු කොටස මගින් තේමාවට අදාළ න්‍යායාත්මක පසුබිම ඉතා සංක්ෂිප්තව සාකච්ඡා කරයි. ලිපියේ දෙවන කොටසේ දී තේමාවට අදාළ ස්ථානීය අධ්‍යයනයන් කෙරෙහි අවධානය යොමුවෙයි.

## අවකාශය සංස්කෘතික මෙවලමක් ලෙස

අවකාශය භෞතික ප්‍රපංචයකි. එහෙත් මනුෂ්‍යයා අවකාශය තුළ ක්‍රියාකාරී වන විට ස්වභාවික අවකාශය සංස්කෘතික ලෙස ප්‍රේරණය වෙයි. සංස්කෘතික ලෙස ප්‍රේරණය වූ අවකාශය හැඳින්වීම සඳහා පුරාවිද්‍යාව තුළ භාවිතවන්නේ සංස්කෘතික භූමිදර්ශනය (cultural landscape) යන පදයයි. සංස්කෘතික භූමිදර්ශනය යන පදය නිර්මාණය කළ කාර්ල් සොයර් (Carl Sauer) ඒ පිළිබඳව මෙසේ කියයි.

> ........සංස්කෘතික කණ්ඩායමක් විසින් ස්වභාවික භූමිදර්ශනය සංස්කෘතික භූමිදර්ශනයක් බවට පරිවර්තනය කරනු ලබයි එහි දී සංස්කෘතිය එම ක්‍රියාවලියේ නියෝජිතයා වන අතර ස්වභාවික ප්‍රදේශය මාධ්‍යය බවට පත්වේ ක්‍රියාවලියේ අවසාන ප්‍රතිඵලය වන්නේ සංස්කෘතික භූමිදර්ශනයයි....... (Sauer 1925)

මිනිසා පරිසරය භාවිත කරන ආකාරය සරල ලෙස සාමාන්‍යකරණය කළ නොහැකිය. අප ජීවත්වන අතිශයින් කාර්මීකරණය වූ නූතනවාදී වර්තමානයේ එය භාවිත වන ආකාරයට වඩා සැහැදිලි සංකීර්ණතාවක් දඩයම් ආහාර එකතු කිරීම සහ කෘෂිකාර්මය ප්‍රධාන යැපීම් ක්‍රම ලෙස භාවිත කළ සමාජ පිය පරිසරය භාවිත කළ ආකාරය මගින් පිළිබිඹු වෙයි. ඔවුන්ගේ යථෝක්ත ජීවන ක්‍රම සෘජු ලෙස පරිසරය සමඟ සම්බන්ධව පැවති හෙයින් පරිසරයේ පවතින ඊට ම ආවේණික අනුමාන කළ නොහැකි බව (unpredictability) හේතු කොටගෙන මනුෂ්‍යයා වෙත දක් වූ ප්‍රතිචාරවල සහ ඒ සමඟ දක් වූ ගනුදෙනුවල අනුමාන කළ නොහැකි තරමේ සංකීර්ණතාවක් ඇති කළේය.